# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,441- 2006 අප්‍රේල් 12 වැනි බදාදා - 2006.04.12

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ජේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... .. | 275 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 274 | මිළ පාලන දැන්වීම් .. ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 275 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 අප්‍රේල් මස 21 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 අප්‍රේල් මස 07 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 81

## ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

2006 ජනවාරි මස 01 වැනි දින සිට තාවකාලික රියර් අද්මිරාල් වශයෙන්

කොමදෝරු බැමිනහැන්නදිගේ ආනන්ද ජයලාල් ගුරුකුල පීරිස්, ආර්එස්පී, යූඑස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ

කොමදෝරු සුනිල් රංජන් සමරතුංග ආර්එස්පී, යූඑස්පී, පීඑස්එන්, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජනවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

04-213

2006 අංක 82

## ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

2005 දෙසැම්බර් මස 11 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන්

ලුතිනන් (ඉ) තිලක් ගාමිණී සිසිර කුමාර උඩුගමගේ, ශ්‍රීලංනාහ

2. ඉහත සඳහන් උසස් කිරීම පරීක්ෂණාත්මක පදනමක් මත වන අතර, උසස් කරන ලද නිලය ඉසිලීමට නුසුදුසු බව පෙනී ගියහොත් නිලධාරියාගේ උසස් කිරීම අවලංගු කොට නැවත පෙර දැරූ නිලයට පත්කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජනවාරි මස 23 වැනි දින,
කොළඹ දී ය.

04-212

---

## ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

2006 පෙබරවාරි මස 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදා ස්ථිර බලකායේ පහත නම සඳහන් නිලධාරියා අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් (සැ) මාලේවන ගම්ලක්ෂගේ හේමජිත් රුක්ෂාන්, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජනවාරි මස 26 වැනි දින,
කොළඹ දී ය.

04-211

# ආණ්ඩුවේ නිවේදන

## හෝමියෝපති වෛද්‍ය සභාවට සභාපතිවරයකු පත්කිරීම

හෝමියෝපති වෛද්‍ය සභාව සඳහා සාමාජිකයන් තෝරා ගැනීමට 2006 වර්ෂයේදී පවත්වන ලද නිලවරණයෙන් තේරී පත් වූ සාමජිකයන් හත්දෙනා අතුරින් එහි සභාපති ලෙස හෝමියෝපති වෛද්‍ය එස්. ඩී. පී. පෙරේරා මහතා 2006.03.13 දින සිට වසර පහක කාලයක් සඳහා තේරී පත් වූ බව දැනුම් දෙනු ලැබේ.

අසෝක මාලිමගේ,
ලේකම්,
දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2006 මාර්තු මස 13 වැනි දින,
දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
අංක 330,
යූනියන් පෙදෙස,
කොළඹ 02.

04-232

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සීමාසහිත සෙලාන් බැංකුව-පියස යුනිට් ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005 නොවැම්බර් 28 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව නිවේදනය කරනු ලැබේ.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒජ් පි. ජේසුදාසන් විසින් සහතික කරන ලද 1999 දෙසැම්බර් මස 15 දිනැති අංක 479 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙදෙනාම සීදූව පදිංචි දීපානි චම්පා කුමාරි හෙට්ටිආරච්චි සහ වර්ණකුලසූරිය ආනන්ද ශ්‍රී ලාල් ප්‍රනාන්දු යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තුන් ලක්ෂ හැත්තෑතුන්දහස් පන්සිය එකයි ශත පනස් අටක් (රු. 3,73,501.58) මුදලක්, 2005 අප්‍රේල් මස 30 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද එකී රු. 3,73,501.58 මුදල ද, 2005 මැයි 1 දින සිට විකිනීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්දෙක (32%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 479 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර රංජිත් එස්. මහානාම මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා උපකාර්යාලයේ රද්දොළුව සීමාව තුළ රද්දොළුව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස්. මැන්දිස් විසින් සාදන ලද 1998.12.23 දිනැති අංක 1463/2 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පරිදි දැන් සෙන්ට්‍රල් ග්‍රීන් ටෙරස් නමින් හඳුන්වනු ලබන දෙල්ගහවත්ත, කැන්දලන්ද සහ දිවිගලේවත්ත නමැති බිම ගස්, වගා ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩමේ කැබැලි අංක 16 ලකුණු කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් උතුරට : එකී අංක 1463/2 දරන සැලැස්මේ කැබැලි අංක 15 සහ 14 ද, නැගෙනහිරට : එකී අංක 1463/1 දරන සැලැස්මේ කැබැලි අංක 17 ද, දකුණට : එකී අංක 1463/2 දරන සැලැස්මේ කැබැලි අංක 19 ද, සහ බස්නාහිරට : එකී අංක 1463/2 දරන සැලැස්මේ කැබැලි අංක 19 ද යන මායිම් තුළ එකී අංක 1463/2 දරන සැලැස්ම අනුව පර්චස් නවයක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 09) විශාල, ඉඩම මෙය මීගමුව ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව බී 142/260 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙහි පහත වැඩිදුරටත් විස්තර කරනු ලබන ඉඩම් කැබැලි උඩින් මාර්ග අයිතිය සමග.

### දෙවැනි උපලේඛනය

1. පෙරකී රද්දොළුව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස්. මැන්දිස් විසින් සාදන ලද 1992.12.27 දිනැති අංක 447 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පරිදි දෙල්ගහවත්ත, කැන්දලන්ද සහ දිවිගලේවත්ත නැමති ඉඩමේ කැබලි අංක 3 (පාර සඳහා වෙන්කිරීම) ලකුණු කළ සම්පූර්ණ ඉඩම් කොටස. මෙය මීගමුව ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව බී122/261 යටතේ ලියාපදිංචි කර ඇත.

2. පෙරකී රද්දොළුව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස්. මැන්දිස් විසින් සාදන ලද 1998.11.14 දිනැති අංක 1463 /1 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පරිදි දැන් සෙන්ට්‍රල් ග්‍රීන් ටෙරස් නමින් හඳුන්වනු ලබන දෙල්ගහවත්ත, කැන්දලන්ද සහ දිවිගලේ වත්ත නැමති ඉඩමේ කැබැලි අංක 1 සහ 2 (පාර සඳහා වෙන්කිරීම) ලකුණු කළ සම්පූර්ණ ඉඩම් කොටස්. මෙය මීගමුව ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ පිළිවෙලින් කාණ්ඩය පත්ඉරුව බී142/248 යන බී142/249 යටතේ ලියාපදිංචි කර ඇත.

3. පෙරකී රද්දොළුව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස්. මැන්දිස් විසින් සාදන ලද 1998.12.23 දිනැති අංක 1463/2 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පරිදි දැන් සෙන්ට්‍රල් ග්‍රීන් ටෙරස් නමින් හඳුන්වනු ලබන දෙල්ගහවත්ත, කැන්දලන්ද සහ දිවිගලේවත්ත නැමති ඉඩමේ කැබැලි අංක 13 සහ 15 (පාර සඳහා වෙන්කිරීම) ලකුණු කළ සම්පූර්ණ ඉඩම් කොටස්. මෙය

මීගමුව ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ පිළිවෙලින් කාණ්ඩය පත්ඉරුව බී142/258 සහ බී142/259 යටතේ ලියාපදිංචි කර ඇත.

### තුන්වැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ අළුත්කුරු කෝරළේ, රාගම පත්තුවේ කටාන ප්‍රාදේශීය සභා උපකාර්යාලයේ රද්දොළුව සීමා තුළ රද්දොළුව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස්. මැන්දිස් විසින් සාදන ලද 1998.11.14 දිනැති අංක 1463/1 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දැන් සෙන්ට්‍රල් ග්‍රීන් ටෙරස් නමින් හඳුන්වනු ලබන දෙල්ගහවත්ත, කැන්දලන්ද සහ දිවිගලේවත්ත නමැති බිම, ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමග සැලැස්මේ කැබැලි අංක 4 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : එකී අංක 1463/1 දරන සැලැස්මේ කැබැලි අංක 02, 03 සහ 01 ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස්. මැන්දිස් විසින් සාදන ලද 1998.11.14 දිනැති එකී අංක 1463/1 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 03 සහ 05 ද, දකුණට : එල්. පෝල් රංජිත් සිල්වා ගේ ඉඩම සහ බස්නාහිරට : අංක 1463/1 දරන සැලැස්මේ සඳහන් කැබැලි අංක 03 සහ 02 සහ අංක 447 දරන සැලැස්මේ සඳහන් කැබැලි අංක 01යන මායිම් තුළ එකී අංක 1463/1 දරන සැලැස්ම අනුව රූඩ් තුනයි පර්චස් විසි දෙකයි දශම එකක් (අක්කර 0, රූඩ් 3, පර්චස් 22.1) විශාල, ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව බී 142/219 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - නීති.

04-198

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.